# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/43 - 2022 මාර්තු මස 30 වැනි බදාදා - 2022.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. - බී. 21/78 (x)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර ඇති, ලියාපදිංචි අංක පී.වී 62877 දරන සමාගමක් වන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2021 ජනවාරි මස 01 වැනි දින අංක 2208/49 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය එහි I වන තීරයේ නිශ්චිත දැක්වෙන "ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

 (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී වාණිජ විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ එයට සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

 (ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුන පාඨමාලාවක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

1A - PG 5796 — 510 (2022/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ කළමනාකරණ ගෞරව | බීඑම්ජීටී ගෞරව (ගිණුම්කරණය සහ මූල්‍ය) |

දිනේෂ් ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

2022 මාර්තු මස 24 වැනි දින,
කොළඹ දීය.

EOG 03 - 1062